**වර්ෂ 2022 ක් වූ ජනවාරි මස 27 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව**

පැමිණීම

01. ගරු සභාපති - ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
02. ගරු උප සභාපති - එච්.ඒ නන්දසෝම මහතා
03. ගරු මන්ත්‍රී - වී.මුරලිදරන් මහතා
04. ගරු මන්ත්‍රී - ශාන්තලාල් පෙරේරා මහතා
05. ගරු මන්ත්‍රී - ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
06. ගරු මන්ත්‍රී - කේ.ඕ.සෝමතිලක මහතා
07. ගරු මන්ත්‍රී - එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
08. ගරු මන්ත්‍රී - ජී.කේ.පී ෆොන්සේකා මිය
09. ගරු මන්ත්‍රී - ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
10. ගරු මන්ත්‍රී - එච්.ජී මෛත්‍රීපාල මහතා
11. ගරු මන්ත්‍රී - එච්.ඒ.එන්.සී රණසිංහ මහතා
12. ගරු මන්ත්‍රී - එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
13. ගරු මන්ත්‍රී - අයි.රාමකිලි මහතා
14. ගරු මන්ත්‍රී - ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
15. ගරු මන්ත්‍රී - පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
16. ගරු මන්ත්‍රී - කේ.ඕ කුසුම්ලතා මිය
17. ගරු මන්ත්‍රී - එස්.එල්.අරුණ ශාන්ත මහතා
18. ගරු මන්ත්‍රී - එන්.එම් සුසිලා දමයන්ති මිය

නොපැමිණීම

01. ගරු මන්ත්‍රී - එච්.ජී මහින්ද ගුණසේකර මහතා
02. ගරු මන්ත්‍රී - එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා

**01. පසුගිය මහා සභා වාර්තාව හා අයවැය සම්මත කිරිමේ වාර්තාව සහා සම්මත කිරිම**

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

පසුගිය සභා වාර්තාවේ මා විසින් ප්‍රකාශයක් කරලා තියෙනවා.එම ප්‍රකාශයේ කොමසාරිස්තුමාගේ හෝ බල ප්‍රදේශයේ කාගේ හෝ මූලිකත්වයෙන් යන කොටස කොමසාරිස්තුමාගේ හෝ එම බල සහිත කාගේ හෝ යනුවෙන් සංශෝධනය කරන්න ඕනි.

ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය

12/30 සභා වාර්තාව සම්මත කරගන්න හදනකොට මම නැගිටලා විරුද්ධ උනා සභා සම්මත කරගන්න බෑ කියලා.ඒක සදහන් වෙලා නෑ.ඊට අමතරව තියෙනවා නොවැම්බර් මාසේ අයවැය ඒකමතිකව සභා සම්මත කරගත්තා කියලා.නමුත් 11 දෙනෙක් විරුද්ධ උනා.එතනත් වැරදි සටහනක් ඇවිත් තියෙන්නේ.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා

2021 දෙසැම්බර් මස 17 දින විශේෂ මහා සභා වාර්තාව හා දෙසැම්බර් මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2021 දෙසැම්බර් මස 17 දින විශේෂ මහා සභා වාර්තාව හා දෙසැම්බර් මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

02 - 01 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,මහනුවර

2022 වර්ෂයේ පළාත් පාලන අයවැය සම්මත කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2022 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සභාගත කරන ලදී.

02 - 03 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

හිමිකම් නිරවුල් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද ඉඩම් සඳහා පළාත් පාලන ආයතන වලින් අනුමැතිය ලබා ගැනීම සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 04 මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,මාලිගා චතුරස්‍රය,මහනුවර

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සිත්ති විනයාගර් කෝවිලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා දීම වෙනුවෙන් රු:209,592.00 මුදල සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 05 ලේකම්,මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන,ප්‍රවාහන,විදුලිබල හා බලශක්ති හා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය,යටිනුවර වීදිය,මහනුවර

දුෂ්කර ප්‍රදේශවල ග්‍රාමීය මාර්ග දෙපස සූර්ය බලශක්ති වීථි ලාම්පු ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 06 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2022 අභ්‍යන්තර විගණන සැලැස්ම - පළමු කාර්තුව සභාගත කරන ලදී.

02 - 07 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,මහනුවර

කාබනික පොහොර නිෂ්පාදකයින් සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 08 අධ්‍යක්ෂ,පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය,මලලසේකර මාවත,කොළඹ 07

පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2022 අධ්‍යයන වර්ෂය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 09 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ

ගරු විෂයය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම - පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2022 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම සභාගත කරන ලදී.

02 - 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2021.12.31 දිනට පළාත් සභා හා රේඛීය අමාත්‍යාංශය සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 12 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාව සභාගත කරන ලදී.

02 - 13 කාර්යභාර ඉංජිනේරු,ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය,ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,කොත්මලේ

මහවැලි ගඟ රක්ෂිතය තුළ නව මාර්ගයක් ඉදිකිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 14 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2022.01.26 දිනට සභා අරමුදල් සංවර්ධන යෝජනා ප්‍රගතිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 15 සහකාර කළමනාකරු(ඉංජිනේරු),ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,නාවලපිටිය

31 - 9698 අංක දරණ වාහනයේ අලුත්වැඩියාව සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 16 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ

හඟරන්ඔය දිය ඇල්ල නැරඹීමට යාමට ඇති ප්‍රවිශ්ය මාර්ගය අවහිර කිරිම හා ඒ ආශ්‍රිත ජෛව විවිධත්වයෙන් යුතු පරිසර පද්ධතිය විනාශ කිරිම සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 17 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රොසැල්ල ග්ලිස්ටන් ශ්‍රී ඥාන ගනේෂර් කෝවිලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සිමෙන්ති ගල් ලබා දීම වෙනුවෙන් රු:64500.00 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 18 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ශ්‍රී සිත්ති විනයාගර් කෝවිලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා දීම වෙනුවෙන් 209,592.00 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 19 එමෙට්සොෆ්ට් ප්‍රයිවට් ලිමිටඩ්,ගාලුපාර,කොළඹ 03

තිබස් මෘදුකාංගය සඳහා අයකරනු ලබන මුදල් විස්තරය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 20 අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,පොල්ගොල්ල

පාරිසරික ආරක්ෂණ බලපත්‍රය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 21 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,මහනුවර</u>
ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය යටතේ පළාත් පාලන විෂයය භාර ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 22 ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,පස්බාගේ කෝරළේ,නාවලපිටිය</u>
ප්‍රාදේශීය සෞඛ්‍ය කමිටු වාර්තාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 23 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරිම - මධ්‍යම පළාත යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 24 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
පළාත් පාලන ආයතන වල සභිකයින්ගේ ධූර කාලය දීර්ඝ කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 25 නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි,ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,පේරාදෙණිය</u>
නාවලපිටිය පල්ලේගම ජල සම්පාදන ක්‍රමය - කබරගල රක්ෂිතය හරහා ජල නල එලීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 26 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
පළාත් පාලන ආයතන විසින් සංචාරක හෝටල් කර්මාන්තයට අදාල ආයතන වලින් අය කරනු ලබන බදු මුදල් සංශෝධනය කිරිම සම්බන්ධව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 27 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
ගරු විෂයය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 28 සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය,ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය,මුදල් අමාත්‍යාංශය,බත්තරමුල්ල</u>
ජීවනෝපාය හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරිම - 2022 වර්ෂය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 29 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
සභාවට අයත් 252 – 6380 දරණ කැබ් රථය අලුත්වැඩියා කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 30 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන නඩත්තු කරනු ලබන මාර්ග ආලෝකන පහන් පද්ධතිය පොදු ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 31 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි පවතින මංමාවත් සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**<u>03. මහජන පෙත්සම්, පැමිණිලි හා ලිපි ඉදිරිපත් කිරිම</u>**

නැත

**<u>04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u>**

නැත

**<u>05. යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

<u>05 - 01 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

අඹුරුවල ඇල්ල වැලි නිධියේ කැණීම් බලපත්‍රයේ රාජ්‍ය භාගය ලෙස සහා අනුමැතිය අනුව ගෙවීමට තිබූ රු:31114.49 ක මුදල භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් අතපසු වීමකින් වැරදි ලෙස ගණනය වීමක් ලෙස ඔවුන් පිළිගන්නා ලදී.එහි නව මුදල ලෙස රු:37457.51 ක මුදලක් ගෙවිය යුතු බව පෙන්වා දෙන ලදී.එම මුදල ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

සිල්වාස්ලැන්ඩ් ප්‍රජා ශාලාව කුලී පදනම මත ලබා දෙන මෙන් වී.ධර්මරාජ් මහතා ඉල්ලීමක් කර තිබෙනවා.ඒ අනුව එම ප්‍රජා ශාලාව මාසිකව රු:500.00 කුලියකට ලබා දීම සුදුසු බවත් ඒ සඳහා ගිවිසුමක් අත්සන් කිරිම සුදුසු බවටත් මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

බල ප්‍රදේශයේ දෛනික කසල කළමනාකරණ කටයුතු සඳහා අවශ්‍ය වන පහත සඳහන් උපකරණ ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

- මිට සහිත 9*9 ප්‍රමාණයේ උදළු 01
- යකඩ මිට සහිත සවල් 02
- රේක්ක 01
- අඟල් 18 දිග රබර් අත්වැසුම් 10
- අඟල් 08 දිග රබර් රෙදි මිශ්‍ර අත් වැසුම් ජෝඩු 10
- ආරක්ෂිත බූට්ස් ජෝඩු 07 (9*2 / 10*2 / 11*1)
- කුඩ රෙදි වැහි කබා 06
- ලයිෆ්බෝයි සබන් කැට 36

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 04 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

2022 වර්ෂයේ ජාතික නිදහස් දිනය සැමරීම උදෙසා කටුකිතුල ජල පෝෂක කලාපය සංරක්ෂණය වෙනුවෙන් රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කරන අතර මේ සඳහා අවශ්‍ය පැළ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පැළ තවානෙන් මිලදී ගත හැකි අතර 2022 අයවැය ලේඛනයේ 205 - 9 – IV යටතේ වෙන් කර ඇති මුදල් භාවිත කර එම කාර්යය ඉටු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 05 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය මගින් සභාව වෙත යොමු කර ඇති ලිපිය අනුව මෙම සභාව අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනයක් බැවින් ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ ලියාපදිංචි වීම සඳහා රු:7500.00 මුදලක් ගෙවිය යුතු බැවින් එම මුදල් ගෙවා සංසදයේ සාමාජිකත්වය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මයා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
ඔය වගේ ගෙවීම් කරන්න අනුමත කරගන්න බෑ නේද?

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
අනුමත කරලා තියාගමු.පස්සෙ ගෙවීම් කරන්න පුලුවන්.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 06 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
මෙම සභාවේ දැනට කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු තාක්ෂණ නිලධාරි එම්.ජී සුමනනන්ද මයාගේ 2021.02.01 දින සිට 2022.01.31 දින දක්වා වසරකින් සේවා කාලය දීර්ඝ කිරිම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇත.එම නිසා එම මහතාගේ සේවා කාලය 2022.01.31 දිනෙන් අවසන් වන හෙයින් 2022.02.01 දින සිට මාස 06 කින් සේවා කාලය දීර්ඝ කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 07 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් යොමු කර ඇති ලිපිය අනුව මෙම සභාව මගින් ඉදි කරන ලද වැලිගොඩවත්ත ග්‍රාම නිලධාරි වසමේ පොම්පීය ජල යෝජනා ක්‍රමය සඳහා ඉඩම් කොටස මැනීම සඳහා රු:32400.00 මැනුම් ගාස්තුවක් මහනුවර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත ගෙවන ලෙසට දැනුම් දී ඇති බැවින් එම ගාස්තු ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 08 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පෙරමඟ පෙර පාසල් පාලිකාව විසින් කර ඇති ඉල්ලීම අනුව පෙර පාසලේ පවතින පහත අවශ්‍යතා සපුරා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

- ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරිම
- සෙල්ලම් උපකරණ වල තීන්ත ආලේප කිරිම
- මුළුතැන්ගෙයක් නිර්මාණය කර ගැනීම
- වැසිකිලියක් ඉදිකර ගැනීම

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
ඒ යෝජනාව මේ අවුරුද්දේ ක්‍රියාත්මක කරන්න බෑ නේද මේ ගැටලුව විසඳෙනකල්.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පුනරාවර්ථන වියදම් නිසා පුලුවන්.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 09 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
නො 142/49 බී,බව්වාගම,සේලම්බ්‍රිජ්,නාවලපිටිය යන ලිපිනයේ පදිංචි පාතිමා සියානා මිය විසින් සභාව වෙත යොමු කර ඇති ලිපිය අනුව ඇයගේ ඉඩම ඉදිරිපස ජලය ගලා යාමට කාණුවක් නොමැති අතර ඒ හේතුවෙන් ඇයගේ නිවසේ මෙන්ම අනෙක් නිවාස වලද ජලය නිවස ඉදිරිපිට රැඳී ඇති බැවින් එයට පිළියමක් වශයෙන් කානුවක් සකස් කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇති බැවින් හා ඒ පිළිබඳ තාක්ෂණ නිලධාරි විසින්ද වාර්තාවක් ලබා දී ඇති බැවින් එම ඉල්ලීම ඉටු කර දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ශ්‍රී මුනිතහස්ත කලායතනයේ කලායතනාධිපති විසින් කර ඇති ඉල්ලීම අනුව වැවේගම ප්‍රජා ශාලාවේ කලායතනයක් ආරම්භ කිරිම සඳහා සභාවෙන් අවසරය ලබා දෙන මෙන් ඉල්ලීමක් කර ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
එම යෝජනාව මම ස්ථිර කරමි.කලායතනය භාර ගුරුතුමා මාත් එක්ක වැඩ කරපු කෙනෙක්.අති දක්ෂ ගුරුවරයෙක්.ඒ නිසා ඒ අවසරය ලබා දුන්නොත් හොදයි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
රඹුක්පිටිය පාසල් මාවතේ කන්දල්ඔය මාර්ගයේ සිට හන්දිය දක්වා ඇති මාර්ගය කාපට් කිරිමේදී වැසි ජලය නිසි ලෙස බෝක්කුව වෙත ගලා යාමට කාණු පද්ධතිය සකසා නොමැති බැවින් අංක 28,29,31 යන ඉඩම් කට්ටි සඳහා වැසි ජලය ගලා ඒමෙන් එම ඉඩම් දැඩි ලෙස බාදනයට ලක්ව ඇත.කරුණු එසේ හෙයින් එම කාණු පද්ධතිය සකස් කර දීම සඳහා ඉල්ලීමක් කර ඇත. මේ පිළිබඳ තාක්ෂණ නිලධාරි මගින් වාර්තාවක් ලබා ගෙන ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 12 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
අංක 23,දංගොල්ල,උඩ රඹුක්පිටිය යන ලිපිනයේ පදිංචි ඩී.ජී ධර්මසේන මහතා විසින් යොමු කරන ලද ලිපිය අනුව උඩ රඹුක්පිටිය දංගොල්ල මාර්ගය ලියාපදිංචි කිරිම සඳහා ඉල්ලීමක් කර ඇති බැවින් ඒ අනුව එම මාර්ගය මැනීමට කටයුතු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 13 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ අධ්‍යක්ෂතුමා විසින් යොමු කරන ලද ලිපිය අනුව එම රෝහල් පරිශ්‍රය තුළ ක්‍රියාත්මක කරනු ලබන අත්‍යවශ්‍ය සංවර්ධන කටයුත්තක් සඳහා සභාවේ බැකෝ යන්ත්‍රය ලබා දෙන මෙන් ඉල්ලීමක් කර ඇති බැවින් එම ඉල්ලීම අනුව සභාවේ බැකෝ යන්ත්‍රය එම ආයතනය වෙත ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 14 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මගින් යොමු කර ඇති ක්ෂේත්‍ර කාර්යාල පහසුකම් ලබා ගැනීම සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය අනුව පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් සඳහා සභාවට අයත් පහත ස්ථාන ලබා දෙන මෙන් කරන ලද ඉල්ලීම අනුව එම ස්ථාන ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

- වැලිගම්පළ ප්‍රජා ශාලාව

- ඉඹුල්පිටිය වත්තට අනුබද්ධව පිහිටා ඇති දළු මඩුව මධ්‍යස්ථානය

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 15 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පළාත් පාලනය පිළිබද ශ්‍රී ලංකා ආයතනය විසින් සභාව වෙතු යොමු කර ඇති ලිපිය අනුව 2022 අධ්‍යන වර්ෂය සදහා පළාත් පාලනය පිළිබද ඩිප්ලෝමා පාඨමාලාවක් පැවැත්වීම සදහා ගරු මහජන නියෝජිතයින් හා නිලධාරින් සම්බන්ධ කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇති බැවින් ඒ අනුව එම පාඨමාලාව සදහා කැමැත්තක් දක්වන මහජන නියෝජිතයින් හා නිලධාරින් පාඨමාලාව සදහා සම්බන්ධ කරවීමටත් එම පාඨමාලා ගාස්තුව ගෙවීම සුදුසු බවටත් මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරිම.**</u>

06 - 01 මුදල් කාරක සභාව - 2022.01.24
06 - 02 ගැටුම් සමථකරණ කාරක සභාව - 2022.01.20
06 - 03 කාර්මික සේවා කාරක සභාව - 2022.01.24
06 - 04 පරිසර හා පොදු පහසුකම් කා.ස - 2022.01.26
06 - 05 ප්‍රජා කමිටුව - 2022.01.25

<u>07. **බැංකු සැසදුම් ප්‍රකාශය,අභ්‍යන්තර විගණන වාර්තාව,ලැබීම් සාරාංශය,ගෙවීම් සාරාංශය,ගෙවීම් වාර්තාව,පුස්තකාල ප්‍රගතිය,ආදායම් රැස් කිරිමේ ප්‍රගතිය ඉදිරිපත් කිරිම**</u>

- 2021.12.01 දින සිට 2021.12.31 දක්වා වවුචර් අංක 1212 සිට 1473 දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.
- බැංකු සැසදුම් ප්‍රකාශය

ගිණුම් අංකය - 053100164889286
මාසය - 2021 දෙසැම්බර්

| | | |
|---|---|---|
| 2021.12.01 දිනට මුදල් පොතේ ශේෂය | රු: 5,470,413.78 | |
| එකතු කළා දෙසැම්බර් මස මුළු ලැබීම් | රු: 5,434,915.98 | |
| අඩු කළා දෙසැම්බර් මස මුළු ගෙවීම් | රු: 8,640,595.70 | |
| 2021.12.31 දිනට මුදල් පොතේ ශේෂය | | රු: 2,264,734.06 |

<u>එකතු කළා</u>

| | | |
|---|---|---|
| නිකුත් කළත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් | රු: 3,317,456.40 | |
| අගරු චෙක්පත් | 2332.00 | |
| | | <u>රු: 3,319,788.40</u> |

5,584,522.46

<u>අඩු කළා</u>

| | | | |
|---|---|---|---|
| බැංකු ගාස්තු | රු | 108.00 | |
| අත ඉතිරි මුදල් | රු: | 86,278.72 | |
| අගරු ගාස්තු | රු: | <u>250.00</u> | <u>රු: 86,636.72</u> |

2021.12.31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය **<u>රු:5,497,885.74</u>**

- 2021 දෙසැම්බර් මස ගෙවීම් සාරාංශය

| විස්තරය | මුදල (රු) |
|---|---|
| 01. වැටුප් හා දීමනා | 2,874,423.33 |
| 02. ගමන් වියදම් | 98,915.90 |
| 03. සැලසුම් හා උපකරණ | 1,452,322.30 |
| 04. ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 546,715.59 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 829,453.18 |
| 06. පොලී ගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 30,709.14 |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 417,513.24 |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 15,833.98 |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | **6,265,886.66** |
| 09. ප්‍රාග්ධන වැය | 780,582.22 |
| 10. ණය ආපසු ගෙවීම් | 1,743,802.43 |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **2,524,384.65** |
| **පුන:වැය හා ප්‍රාග්:වැය මුළු එකතුව** | **8,790,271.31** |
| විවිධ ණය හිමියන් | |
| කර්:ණය හිමියන් (309-3-1) | 288,631.35 |
| කර්:ණය හිමියන් (309-3-111) | - |
| කර්:ණය හිමියන් (304-5) | 219,170.00 |
| 10% කර්මාන්ත තැම්පත් | 100,713.94 |
| විවිධ තැම්පත් | 47,565.00 |
| මුද්දර තැම්පත් | - |
| දේපල ණය | 9,936.53 |
| සේවක ණය | 106,165.00 |
| අත්තිකාරම් | 557,296.80 |
| සමුච්චිත අරමුදල | - |
| ලිපි ද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | 147,120.00 |
| ජල ගබඩා අත්තිකාරම් | 692,218.56 |
| අගරු චෙක්පත් | |
| කර්:ණය ගැතියන් | |

| | |
|---|---|
| **එකතුව** | 2,168,817.18 |
| **2021.12.31 දක්වා මුළු ගෙවීම් එකතුව** | **10,959,088.49** |

- 2021 දෙසැම්බර් මස ලැබීම් සාරාංශය

| • අය විෂයය නාමයන් | මුදල (රු) |
|---|---|
| 10 වරිපනම් හා බදු | 566,186.14 |
| 20 කුලී | 348,812.80 |
| 30 බලපත්‍ර ගාස්තු | 130,328.40 |
| 40 සේවා සඳහා ගාස්තු | 196,005.43 |
| 50 වරෙන්තු ගාස්තු | 16,975.34 |
| 60 වෙනත් ආදායම් | 337,443.63 |
| 70 වෙනත් ආධාර | 2,486,994.37 |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් එකතුව | 5,345,532.85 |
| ජල ණය ගැතියෝ | 13,020.00 |
| ජල තැම්පත් | 4,500.00 |
| මුද්දර | 4,025.00 |
| විවිධ තැම්පත් | 39,349.01 |
| සේවක ණය | 201,657.53 |
| කර්මාන්ත තැම්පත් | 99,598.26 |
| දේපල ණය | |
| විවිධ ණය ගැතියෝ | |
| අත්තිකාරම් පියවීම | 2,232,578.70 |
| රු 25 මුද්දර | 1,400.00 |
| කර්මාන්ත ණය ගැතියෝ | |
| වෙනත් ලැබීම් | **2,596,128.50** |
| 2021.12.31 දක්වා මුළු ලැබීම් | **7,941,661.35** |

- 2021 දෙසැම්බර් මස පුස්තකාල ප්‍රගතිය

01. නව සාමාජික සංඛ්‍යාව - 04

02. සාමාජිකත්වය අලුත් කළ සංඛ්‍යාව - 06

03. පොත් බැහැර දීම - 859

04. ව්‍යාප්ත සේවා -

- ජාතික කියවීමේ මාසයට සමගාමීව ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ අත් පත්‍රිකාවක් මුද්‍රණය කර බෙදා හැරීම.
- ගෙවතු වගාව සඳහා බීජ හා පැළ බෙදා දීම(මැදගහවතුර ජංගම පුස්තකාලය - 2021.12.29 දින)
- 2021.12.29 දින මැදගහවතුර ජංගම පුස්තකාල පාඨකයින් සඳහා ඵලදායිතා සංකල්ප හා ගෙවතු වගාව පිළිබඳ දේශන පැවැත්වීම.

05. රැස්කළ ආදායම(පුස්තකාල)- 940.00

(නැණසල) - 2600.00

**<u>08.ටෙන්ඩර් මණ්ඩලය</u>**

08 - 01 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා අවශ්‍ය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | ජයන්ති ටිම්බර් ඩිපොට්,නාවලපිටිය | මිත්‍රානි ඩිස්ට්‍රිබියුටර්ස්,බෙලි පාර,නාවලපිටිය | සමගි ෆර්නිචර්ස්,නාවලපිටිය |
|---|---|---|---|
| ලාච්චු කබඩ් 01 | 20500.00 | 20300.00 | 19500.00 |
| ලියන මේස 01 | 27500.00 | 27000.00 | 26800.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති “සමගි ෆර්නිචර්ස්,නාවලපිටිය” යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 02 සභාව සතු LL 7484 වාහනය සඳහා ටයර් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| එම්.ජේ.ආර් පීරිස් හා පුත්‍රයෝ,කටුගස්තොට පාර,මහනුවර | කොත්මලේ ටයර් හවුස්,නාවලපිටිය | ස්ටෙනෝර් ටයර් හවුස්,නාවලපිටිය | රිතූ ටයර් සෙන්ටර්,නාවලපිටිය |
|---|---|---|---|
| 27766.80 | 30300.00 | 30950.00 | 25750.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති “රිතූ ටයර් සෙන්ටර්,නාවලපිටිය” යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 03 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා අවශ්‍ය 4*3.5 ප්‍රමාණයේ දැන්වීම් පුවරුවක් සකස් කිරිම සඳහා මිල ගණන් කැඳවීම.

| මිලිඳු ඉංජිනියරින් වර්ක්ස්,මීපිටිය,නාවලපිටිය | සෙන්ට්‍රල් ඉංජිනියරින්ග් වර්ක්ස්,නාවලපිටිය | සීගිරි ලේත් වර්ක්ස්,කොත්මලේ පාර,නාවලපිටිය |
|---|---|---|
| 11000.00 | 11000.00 | 10200.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති “සීගිරි ලේත් වර්ක්ස්,කොත්මලේ පාර,නාවලපිටිය” යන ආයතනයෙන් අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 04 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා අවශ්‍ය සංගීත භාණ්ඩ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | දෙහිඅත්තකණ්ඩිය මියුසික් සෙන්ටර්,දෙහිඅත්තකණ්ඩිය | ඕෂධී මියුසික් සෙන්ටර්,ගම්පොල | නෙත්මි මියුසික් සෙන්ටර්,මල්දෙණිය,හැටන් |
|---|---|---|---|
| තබ්ලා 01 | 24500.00 | 23500.00 | 22500.00 |
| ඩොල්කි 01 | 5200.00 | 4700.00 | 4200.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති “නෙත්මි මියුසික් සෙන්ටර්,මල්දෙණිය,හැටන්” යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 05 පෙර පාසල සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය හා උපකරණ සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | කැන්ඩි ස්ටෝර්ස්,නාවලපිටිය | ශ්‍රී ගෞරීස්,නාවලපිටිය | ශ්‍රී ලංකා ස්ටෝර්ස්,නාවලපිටිය |
|---|---|---|---|
| සී.ආර් තනිරුල් පොත් | 147.50 | 145.00 | 130.00 |
| නාම ලේබන | 32.50 | 35.00 | 30.00 |
| ඔරලෝසු | 695.00 | 690.00 | 675.00 |
| සීනුව | 2675.00 | 2600.00 | 2500.00 |

| | | | |
|---|---|---|---|
| රතු පෑන් | 14.00 | 13.50 | 12.50 |
| වයිට් බෝඩ් පෑන් | 77.50 | 77.50 | 75.00 |
| කොසු | 347.50 | 335.00 | 325.00 |
| ඉදල් | 195.00 | 200.00 | 190.00 |
| පොඩි කොසු | 295.00 | 300.00 | 275.00 |
| පොඩි ඉදල් | - | - | - |
| සබන් කැට | 60.00 | 60.00 | 53.00 |
| විෂබීජ නාශක දියර | 175.00 | 180.00 | 170.00 |
| පොඩි බෙර | - | - | - |
| පොඩි රබන් | 335.00 | 310.00 | 295.00 |
| ගණක රාමු | 325.00 | 310.00 | 295.00 |
| ලොකු බෝල | 110.00 | 110.00 | 100.00 |
| බැට් | 965.00 | 1100.00 | 950.00 |
| හාර්පික් | 235.00 | 230.00 | 225.00 |
| ළමා පැනඩෝල් | 225.00 | 225.00 | 220.00 |
| රිජිෆෝම් | 565.00 | 560.00 | 550.00 |
| ආයුධ කට්ටල | 340.00 | 340.00 | 325.00 |
| බෝනික්කන් | 675.00 | 700.00 | 625.00 |
| එළවළු | 375.00 | 350.00 | 335.00 |
| පළතුරු | 375.00 | 375.00 | 335.00 |
| සතුන් | 290.00 | 275.00 | 265.00 |
| දූවිලි පිස්නා | 110.00 | 120.00 | 110.00 |
| ලොකු ලේන්සු | 87.50 | 85.00 | 80.00 |
| ඩබල් ටේප් | 95.00 | 95.00 | 90.00 |
| මීටර් කෝදු | 110.00 | 110.00 | 100.00 |
| අසමෝදගම් | 125.00 | 120.00 | 110.00 |
| බැන්ඩේජ් | 87.50 | 85.00 | 80.00 |
| පෝස්ටර් | - | - | - |
| ඉටි කවර | 45.00 | 45.00 | 40.00 |
| පොත් කවර | 665.00 | 660.00 | 650.00 |

මේ පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති "ශ්‍රී ලංකා ස්ටෝර්ස්,නාවලපිටිය" යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 06 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ උඩු මහල සදහා අවශ්‍ය තිරරෙදි මිලදී ගැනීම සදහා මිල ගණන් කැදවීම.

| චමත් කර්ටන් හවුස්,නාවලපිටිය | ගම්පොල කර්ටන් හවුස්,ගම්පොල | ජයසූරිය කර්ටන්ස්,නාවලපිටිය |
|---|---|---|
| 178600.00 | 171330.00 | 147645.00 |

මේ පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති "ජයසූරිය කර්ටන්ස්,නාවලපිටිය" යන ආයතනයෙන් අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 07 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සදහා අවශ්‍ය ඉලෙක්ට්‍රොනික් උපාංග මිලදී ගැනීම සදහා මිල ගණන් කැදවීම.

| විස්තරය | සනුක ඉලෙක්ට්‍රිකල්ස්,නාවලපිටිය | නාවලපිටිය ඉලෙක්ට්‍රිකල්,නාවලපිටිය | ප්‍රියා ස්ටෝර්ස්,ගම්පොල |
|---|---|---|---|
| කේසින් (20) | 10500.00 | 8800.00 | 9200.00 |

| | | | |
|---|---|---|---|
| වයර් 7067 (2) | 49000.00 | 47760.00 | 47920.00 |
| අර්ත් වයර් (2) | 22400.00 | 21160.00 | 21400.00 |
| සන් බොක්ස් (6) | 510.00 | 450.00 | 480.00 |
| ප්ලග් 13A (6) | 3540.00 | 3240.00 | 3360.00 |
| ඇණ (100) | 500.00 | 300.00 | 400.00 |
| M.C.B (30) | 1250.00 | 1140.00 | 1190.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති "නාවලපිටිය ඉලෙක්ට්‍රිකල්,නාවලපිටිය" යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 08 සභාව සතු 31 ශ්‍රී 9698 ජීප් රථයේ එන්ජිම අලුත්වැඩියා කිරිම සඳහා උපාංග මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| ද්‍රව්‍යය | කොඩිතුවක්කු මෝටර්ස්,මහනුවර | මෝටර් එන්ටර්ප්‍රයිසස්,මහනුවර | විජය මෝටර්ස්,මහනුවර |
|---|---|---|---|
| පිස්ටන් 4 | 21500.00 | 21500.00 | 19400.00 |
| සිලුම් 4 | 12000.00 | 12750.00 | 11000.00 |
| එන්ජින් බ්ලොක් 1 | 52500.00 | - | 45000.00 |
| ක්‍රෑංග් 1 | 45000.00 | - | 40000.00 |
| මේන් බෙයාරින් සෙට් | 4250.00 | 4500.00 | 4200.00 |
| බිගන් බෙයාරින් | 3250.00 | 3300.00 | 3100.00 |
| ත්‍රස් බෙයාරින් | 1050.00 | 1050.00 | 975.00 |
| ක්‍රෑම් බුෂ් සෙට් | 1950.00 | 2100.00 | 1800.00 |
| රොඩ් 2 | - | - | 8000.00 |
| රොඩ් බුෂ් 4 | 5200.00 | - | 4800.00 |
| පුල් ගැස්කට් සෙට් | 14750.00 | 9500.00 | 8800.00 |
| වැල් ගයිඩ් 8 | 4000.00 | 3900.00 | 3800.00 |
| වැල් සීට් 8 | - | 9750.00 | 8500.00 |
| වැල් ඇක්ස්සෝස් ඉන්ගලඩ් | 11200.00 | 12000.00 | 9600.00 |
| නොසල් 4 | - | 11000.00 | 10000.00 |
| ක්ලච් ප්ලේට් | 27500.00 | 29500.00 | 26500.00 |
| පෙෂර් ප්ලේට් | 47500.00 | 44800.00 | 43000.00 |
| ක්ලච් රේසරය | 3900.00 | 3900.00 | 3500.00 |
| එන්ජින් මවුන්ට් 2 | 7000.00 | 7000.00 | 6000.00 |
| ඔයිල් ෆිල්ටරය | 1100.00 | 1200.00 | 1050.00 |
| ඩීසල් ෆිල්ටරය | 1000.00 | 1050.00 | 900.00 |
| ඇබ්රෝ ගම් 2 | 2100.00 | 2200.00 | 2000.00 |
| සැලග් ගම් 1 | 600.00 | 650.00 | 575.00 |
| එන්ජින් ඔයිල් 8 | 11800.00 | 12750.00 | 11600.00 |
| ජියර් ඔයිල් ලීටර් 5 | 8750.00 | 8750.00 | 8000.00 |
| රේඩියේටර් හෝස් 2 | 3900.00 | 4200.00 | 3500.00 |
| ඕල්ටනේටර් හෝස් 2 | 3500.00 | 3500.00 | 3000.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර එහි තීරණය අනුව අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 09 සභාව සතු කැනොන් ජායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරිම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | මන්දිනු ට්‍රේඩින්ග්,ගම්පොල | Extreme Trading Company,Kandy | Pulmo Technologies,Gampola |
|---|---|---|---|
| Canon Heater Belt | 14750.00 | 15500.00 | 10800.00 |
| Bushings | 3500.00 | 3200.00 | 1800.00 |
| Service Charges | 2500.00 | 2000.00 | 2000.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති “Pulmo Technologies,Gampola” යන ආයතනයෙන් අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 10 සභාව සඳහා අවශ්‍ය ජල නල උපාංග මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | කේ.එස් ද සිල්වා සහ පුත්‍රයෝ,කුරුණෑගල | ජයලංකා හාඩ්වෙයාර්,අටබාගේ, ගම්පොල | මහනුවර ඒජන්සීස්,මහනුවර |
|---|---|---|---|
| 20mm socket | 20.00 | 29.50 | 24.96 |
| 32mm socket | 43.00 | 70.00 | 58.50 |
| 40m socket | 67.00 | 102.00 | 85.80 |
| 50mm socket | 94.25 | 150.00 | 124.80 |
| 63mm Socket | 132.50 | 200.00 | 167.70 |
| 90mm Socket | 340.00 | 610.00 | 499.00 |
| 110mm Socket | 600.00 | 850.00 | 682.50 |
| 40mm Valve Socket | 82.00 | 125.00 | 101.40 |
| 32mm Foucet Socket | 50.50 | 70.00 | 58.50 |
| 40mm Foucet Socket | 88.00 | 130.00 | 105.30 |
| 50mm Foucet Socket | 116.00 | 180.00 | 144.30 |
| 32mm Elbow | 45.50 | 70.00 | 58.50 |
| 50mm Elbow | 142.00 | 215.00 | 175.50 |
| 63mm Elbow | 188.00 | 330.00 | 257.40 |
| 90mm Elbow | 550.00 | 912.00 | 725.40 |
| 32mm Bend | 64.00 | 105.00 | 89.70 |
| 50mm Bend | 230.00 | 350.00 | 308.10 |
| 63mm Bend | 370.00 | 575.00 | 510.90 |
| 110mm Bend | 3350.00 | 3700.00 | 3014.70 |
| 20mm T Socket | 23.25 | 36.00 | 31.20 |
| 40mm T Socket | 120.00 | 180.00 | 148.20 |
| 50mm T Socket | 207.00 | 300.00 | 245.70 |
| 63mm T Socket | 269.00 | 410.00 | 335.40 |
| 90mm * 63mm T | 1200.00 | 1300.00 | 1068.00 |
| 50mm Rubber Socket | 1450.00 | - | - |
| 40mm Valve | 670.00 | 800.00 | 536.00 |
| 63mm Valve | 1350.00 | 1360.00 | 1088.00 |
| 20mm Pipe (PNT 11) | 34.50 | 287.00 | 325.00 |
| 32mm pipe (PNT 11) | 1214.00 | 1080.00 | 1435.00 |

| | | | |
|---|---|---|---|
| 40mm Pipe (PNT 11) | 1525.00 | 1440.00 | 2064.00 |
| 50mm Pipe (PNT 11) | 2379.00 | 2316.00 | 2900.00 |
| 90mm Pipe (PNT 11) | 7566.00 | 11132.00 | 14400.00 |
| 110mm Pipe(PNT 11) | 16450.00 | 14141.00 | 18300.00 |
| Solvent Cement 500 | 1775.00 | 1970.00 | 1580.00 |
| Blade | 195.00 | 190.00 | 125.00 |
| 20mm Elbow | 18.50 | 30.00 | 25.74 |
| 20mm valve socket | 24.25 | 40.00 | 33.54 |
| 20mm valve | 210.00 | 240.00 | 176.00 |
| 40mm valve | 670.00 | 800.00 | 536.00 |
| 50mm*20mm ක්ලැම්ප් | 1425.00 | 590.00 | 930.00 |
| 50mm*20mm T Socket | 90.00 | 220.00 | 176.00 |
| 63mm Valve Socket | 144.00 | 230.00 | 183.30 |
| 63mm*20mm ක්ලැම්ප් | 1450.00 | 635.00 | 985.00 |
| 63mm ගම් සොකට් | 200.00 | 249.00 | 167.70 |
| 63mm pipe(PNT 11) | 4140.00 | 3535.00 | 4696.00 |
| 63mm Valve | 1350.00 | 1360.00 | 1088.00 |
| 90mm රබර් සොකට් | 3590.00 | - | 1627.50 |
| 90mm*20mm ක්ලැම්ප් | 1590.00 | 882.00 | 1476.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර එහි තීරණය අනුව අදාල මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 11 සභාව සතු 31 - 9698 අංක දරණ ජීප් රථයේ අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවීම.

| විස්තරය | උදාරා මෝටර්ස්,ඉඹුල්පිටිය,නාවලපිටිය |
|---|---|
| සිලුවි බෝල් කිරිම | 15000.00 |
| කුැම් බුෂ් බැස්සීම | 5500.00 |
| ගජර්පින් බුෂ් බැස්සීම | 4000.00 |
| ලයින් බෝර් කිරිම | 15500.00 |
| හෙඩ් චෙක් කිරිම | 3500.00 |
| හෙඩ් පේස් කිරිම | 3000.00 |
| වැල් ගයිඩ් බැස්සීම | 1550.00 |
| වැල් සිටි බැස්සීම | 4500.00 |
| ඉන්ජෙක්ටර් පොම්පය අමතර කොටස් දමා සවි කිරිම | 47000.00 |
| නොසල් පෙෂර් කිරිම | 3000.00 |
| රේඩියේටරය ශුද්ධ කිරිම | 3500.00 |
| එන්ජිම සම්පූර්ණයෙන්ම ගලවා සවි කිරිම | 75000.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත අලුත්වැඩියාව අභ්‍යන්තර අලුත්වැඩියාවක් බැවින් මිල ගණන් ඉදිරිපත් කර ඇති "උදාරා මෝටර්ස්,ඉඹුල්පිටිය,නාවලපිටිය"යන ආයතනයට අදාල අලුත්වැඩියා කටයුතු සිදු කිරිම සඳහා ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>09. වෙනත් කරුණු</u>**

නැත

සාකච්ඡා කිරිමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි පිරිසට ස්තුතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 12.30 පමණ අවසන් කරන ලදී.

ලේකම්,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

සහකාර කොමසාරිස්තුමිය කිව්වේ කරුණු කීපයක් ඉදිරිපත් උනා ඒකෙන් දෙකක් සංශෝධනය කරනවා කියලා තමයි.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>

ඒකෙදි අයවැය සභා සම්මත උනේ නෑ.හදිසි කැඳවීම කළේ වියදම් දැරීමට පමණක් අනුමැතිය දෙන්න.අයවැය සභා සම්මත වෙලා නෑ.ඒ අයවැය අපිට ලැබුනෙත් නෑ.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

ඒක ඔබතුමා කැමති විධියට නිර්වචනය කරගන්න.ඒක ගැටලුවක් නෑ.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>

සහකාර කොමසාරිස්තුමිය ආව වේලාවේ දුන්න අයවැයේ කිසිම සංශෝධනයක් නෑ කියලා කිව්වා.12/17 දුන්න එකේ. නමුත් ඒකෙ තියෙනවා සංශෝධනත් එක්ක තමයි දීලා තියෙන්නේ.එතනත් වංචාවක් වෙලා තියෙනවා.දිගින් දිගටම මෙහෙම උනාම කොහොමද අපි හරි තීරණයකට එන්නේ.සහකාර කොමසාරිස්තුමිය දුන්න අයවැය ඔබතුමන්ලා අධ්‍යනය කරන්න ඕනි කියලා කියනවා එතකොට අපි අධ්‍යනය කරන්න ඕනි නැද්ද.කථාව ගිහින් තියෙන්නේ අපි අයවැය සම්මත කරේ නැති නිසා හැමෝටම පඩි ගෙවන්න බැරි වෙලා කියලා.ඒක නෙවෙයි ඇත්ත.අපි 13 වෙනිදා කිව්වේ සභාව පවත්වා ගෙන යන්න ඕනි වියදම් වලට විතරක් අනුමැතිය දෙන්නම් කියලා.නමුත් අපි තවම දන්නේ නෑ මොනවද අනුමත උනේ කියලා.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>

එතුමිය සාකච්ඡාවේදී එකක් කියනවා ලිඛිතව තව එකක් එවනවා.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
හඟරන්ඔය දිය ඇල්ල සම්බන්ධව අපි දිගින් දිගටම කථා කරා.මේ වෙනකොට ප්‍රාදේශීය ලේකම්තුමා විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කරමින් පවතිනවා.ඒවගේ මැනුම් ගාස්තු ගෙවන්නත් අපි සභා තීරණ ගත්තා.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
ඒ ඉඩමට ඔප්පුවක් නෑ කියලා තහවුරු වෙලා තියෙනවා.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
ගරු සභාපතිතුමා අපේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරිමේදී සිමෙන්ති නැති ගැටලුව නිසා ඒ කර්මාන්ත කරන්න කාලය මදි උනා.ඒ නිසා ඒකට කාලයක් ලබාදෙන්න පුලුවන් නම් හොදයි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
12/31 දිනට කලින් ගිවිසුම් අත්සන් කරලා තියෙන ඒවා නම් පුලුවන්.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
මහවැලි ගඟ රක්ෂිතයෙහි ඉදි කරනු ලබන මාර්ගය ප්‍රදේශයේ පවුල් 25 විතර ඉන්නවා.සති 2 විතර කලින් මැනුම් කරා ඔප්පු දෙන්න.ගඟ රක්ෂිතයට වෙන් කරන අඩි 60 තමයි අඩි 16 පාර ලකුණු කරේ එල්ආර්සී එකට කියලා.ඉඩම් අල්ලගෙන ඉන්න දෙන්නෙක් තමයි විරුද්ධ වෙලා තියෙන්නේ.

<u>කාර්මික සේවා කාරක සභාව</u>
<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
පාර හදනකොට මහවැලි හාඩ්වෙයාර් එක ළඟින් තමයි වතුර ගලාගෙන ගියේ.දැන් එතන ඉදිකිරිම කරලා තියෙනවා ගොඩ කරලා.දැන් පාරේ වතුර පිරෙනවා.වතුර බැස්ම තමයි සකස් කරන්න ඕනි.අවධානමක් තියෙන්නේ එතන.මාර්ග සංවර්ධන අධිකාරියටවත් දැනුම් දුන්නොත් හොදයි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දෙමු.මහවැලි හාඩ්වෙයාර් එකටත් දැනුම් දෙමු ඉදිකිරිම විධිමත් කරන්න කියලා.

<u>පරිසර හා පොදු පහසුකම් කාරක සභාව</u>
<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
හෝල්ගම හන්දියේ කසල දැමීම ලොකු ගැටලුවක් වෙලා තියෙනවා.අපි එක පාරක් කුණු ටික අයින් කරලා පුවරුවක් ගහමු.පරිසර මහතාට උපදෙස් දෙන්න සතියක් ඇතුළත කුණු ඉවත් කරලා පුවරු ගහන්න කියලා.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
අපි සභාවෙන් යෝජනාවක් ගෙනාවා සෙහොන් භූමි මනිමු කියලා.ඒ වැඩේ කරගන්න බැරිඋනා.දෙල්ගහඇල්ල සුසාන භූමියට ගියා.පාරක් කපලා තියෙනවා එතන.මං හිතන්නේ අපේ කොටස මැනලා පාර නිරවුල් කරලා දුන්නොත් හොදයි.ලොකු ගැටලුවක් වෙලා තියෙනවා.අපි වැරදි වෙලා තියෙන්නේ.සභාව පවත්වා ගෙන යාමේදී ගැටලුකාරි තත්ත්වයක් තියෙනවා කියලා කිව්වා.13 වෙනිදා ඇවිල්ලා සහකාර කොමසාරිස්තුමිය කිව්වේ සභාව අවිච්ඡින්නව පවත්වා ගෙන යන්න අවශ්‍ය වියදම් වලට අනුමැතිය දෙනවා කියලා.දිගින් දිගටම සභාපතිවරයා ඉවත් කිරිමේ අවශ්‍යතාවය තියෙනවනම් අපි ඒකට පියවර අරන් තියෙන්නේ.නීතිපති උපදෙස් එනකල් බලාගෙන ඉමු.සහකාර කොමසාරිස්තුමිය ලිඛිතව එවලා තියෙනවා නම් කරන්න ඕනි විධිය අපිට වෙන

කරන්න දෙයක් නෑ.අයවැයට අපි 11 දෙනෙක් විරුද්ධ උනා.9 දෙනෙක් පක්ෂ උනා.මේ සම්බන්ධයෙන් තීරකයා වෙන්න ඕනි පළාත් පාලන කොමසාරිස්තුමා.ඒ නිසා මේ චෝදනාව යන්න ඕනි එතුමට.සභාවේ කටයුතු වලට හා ජනතාවට සේවයක් කරන්න අපි කටයුතු කරමු.සභාවේ සියලුම වාහන සදහා සභාවේ නම පැහැදිලිව පේන ආකාරයට ස්ටිකරයක් ගහමු කියන යෝජනාව මම කරනවා.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
2021 වියදම් කරපුවා තමයි මේ ඉදිරිපත් කරලා තියෙන්නේ.2022 වර්ෂයේ ඒ කිසි දේකට සභාව අනුමැතිය දෙන්නේ නෑ.සහකාර කොමසාරිස්තුමිය කිව්වා වැටුප් හා නඩත්තු වලට විතරයි ගෙවීම් කරන්න කිව්වේ.2022 වර්ෂයට වියදම් කරන්න යම් කිසි තීරණයක් ගත්තොත් හොදයි කියන එක මං යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
සභාවේ අයවැයට අපි අවුරුදු 3 ක් පක්ෂව ජන්දය දුන්නා.සභාවේ මන්ත්‍රී ප්‍රතිපාදන වලට අමතරව වෙන කිසිම දෙයක් අපිට ලැබිලා නෑ.සභාවට ආව අලුතම මම කිව්වා වැවේගම වතුර ගැටලුව ගැන.මේ වෙනකල් විසඳුමක් නෑ.පුෂ්පකුමාර මන්ත්‍රීතුමාගේ ලක්ෂ 1 ½ බට වලට වියදම් කරා.පස්සේ බට ටික ගලවලා අයින් කරා කිව්වා.ඒ බට වලට මොනවද උනේ කියලා දන්නේ නෑ.බට මදිවෙලා පස්සේ අපේ පවුල් වලින් සල්ලි එකතු කරලා බට ගත්තා.ඒවත් දැන් නෑ.ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපති තමයි මේ පරිහානි සියල්ලටම වගකිව යුත්තේ.මන්ත්‍රීතුමාට ඉහලින් එයා වැඩ කරන එකේ අනිසි ප්‍රථිඵල තමයි මේ තියෙන්නේ.ලේකම්තුමියටත් මං කතා කරලා කිව්වා.අපේ අසල්වැසි ගෙදරින් සභාපතිතුමාට ලියුමක් එවලා තිබුණා.එයාලාගේ වත්ත මැදින් තමයි වතුර බටේ යන්නේ.අපේ වතුර බටේ දාලා තියෙන්නෙත් වත්ත මැදින්.එයාලා මට වතුර බටේ ගලවලා අයින් කරගන්න කිව්වා.සභාවෙන් ගිහින් බලලා ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපතිට ඕනි විධියට තවත් වත්තකින් දැම්මා.දැන් ගැටලුව වතුර හදන වෙලාවට ඒ වතු දෙක මැදින්ම මම යන්න ඕනි.අපිට වතුර එන්නෙම නෑ.ලැජ්ජයි කියන්න සභාවේ මන්ත්‍රීවරියක් විධියට.කාටවත් ගැටලුවක් නෑ ප්‍රධාන පාර අයිනෙන් වතුර බටේ දැම්මා නම්.හැමෝටම වතුර එනවා.මට වතුර ටිකක් නෑ බොන්න වත්.සභාවෙන් වෙනම සල්ලි දාන්න ඕනි නෑ අර බට ටික හොයලා දැම්ම නම්.මගේ වතුර ගැටලුව විසඳෙනකල් වතුර බිල ගෙවීමට හැකියාවක් නම් නෑ.ඔබතුමාලාගේ ඉඩම් ලබා දීමේ වැඩසටහනේදී මන්ත්‍රීතුමා කිව්වලු ශිරෝමිගේ කාටවත් දෙන්න එපා කියලා.අපි වැඩ කරේ එක්සත් ජාතික පක්ෂයට නෙවෙයිනේ.ඒ වගේ අසාධාරණකම් කරන්න එපා.සුදුස්සාට ඉඩම් දෙන්න.කමිටු වලදී හැම මන්ත්‍රී කෙනෙක්ම නියෝජනය වෙන විධියට දානවා නම් හොදයි කියලා ඉල්ලීමක් කරනවා.ලක්මාල් වෛද්‍යතුමා නැති උන වේලාවේ සහභාගී උන සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා.ඒ වගේම වැවේගමට දවල් 1.40 ට බස් එකක් යනවා.පාසල් අරින්නේ 1.30 ට.ඊට පස්සේ 2.40 බස් එක යන්නේ.ළමයි ටවුමේ පැයක් ඉන්නවා.1.40 බස් එක වෙනස් කරලා 1.50 වත් යවන්න පුලුවන් නම් හොදයි.

<u>ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි</u>
හාමුදුරුවන්ගේ අපවත් වීම සදහා සභාවෙන් ලක්ෂයක් වියදම් කරන්න අනුමැතිය දුන්නා.ඒ මුදලට වඩා වියදම් වෙලා තියෙනවද?සභාව පවත්වා ගෙන යන්න ඕනි වියදම් වලට අපි සහයෝගය දෙනවා.නමුත් අපි අයවැයට විරුද්ධයි.කඩියන්ලෙන නගරයේ වැසිකිළි පද්ධතිය අවහිර වෙලා.ඒ ගැටලුව විසදලා දුන්නොත් හොදයි.

<u>ගරු මන්ත්‍රී එන්.එම්.එස් දමයන්ති මිය</u>
සභාපතිතුමාගේ සම්බන්ධීකරණ නිලධාරි වෙනුවෙන් රු:25000.00 විතරද ගෙවන්නේ.ගෙවීම් විස්තරයේ තියනවා වවුචර් අංක දෙකකින් සම්බන්ධීකරණ නිලධාරි දීමනාව ගෙවලා.සහකාර කොමසාරිස්තුමිය එවපු අයවැය අපිට ලැබෙනකල් අපි කිසිම දේකට අනුමැතිය දෙන්නේ නෑ.උප සභාපතිතුමා කිව්වා වගේ අලුත් මන්ත්‍රීවරු ගැන හිතලා සභා කාලය දීර්ඝ කළා නෙවෙයි ඒක රජයේ තියෙන දුර්වලකම.ජන්දයක් තියාගන්න බැරිකම.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
12/31 ගිණුම අවසන් කරන්න ඕනි නිසා මාස 2 මුදල එකවර ගෙවලා තියෙන්නේ.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>

ශිරෝමි මන්ත්‍රීතුමියගේ ජල ගැටලුවට ඔබතුමා මැදිහත් වෙලා විසඳුමක් ලබා දෙන්න.තෙබුගොල්ල ජල පාරිභෝගිකයින්ට සහනයක් දුන්නා මීටර් ගාස්තු රු:100.00 කරලා.එයාලා නඩත්තු කටයුතු සිදු කරගන්න නිසා.දැන් ජල ගාස්තු 150.00 අය කරනවා.ඒ ගැන බලන්න.සභා කාලය දීර්ඝ කරපු එක රජයේ දුර්වලකමක් නොවෙයි.ඔබතුමාලගේ යහපාලන ආණ්ඩු කාලේ අවුරුදු 3 ක් දීර්ඝ කරා.පළාත් සභා තවම තියාගන්න බැරුව ඉන්නවා.කොරෝනා වසංගතයත් එක්ක රජයට ජනතාව වෙනුවෙන් කරන්න නොහැකි උන දේවල් කරන්න තමයි කාලය දීර්ඝ කලේ.සංවර්ධන ව්‍යාපෘති ගණනාවකට මුදල් වෙන් කරලා තියෙනවා.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

පසුගිය කාලයේ දැකපු දුර්වලම දේ තමයි පළාත් පාලන මැතිවරණ පනත සංශෝධනය කිරීම.යම් පනතක් සංශෝධනය වෙන්න ඕනි ඒ ආසනය ජයග්‍රහණය කළ පක්ෂයට ආයතනය පවත්වා ගෙන යන්න හැකි වෙන්න.ව්‍යවස්ථාව තුළ ලොකු අර්බුදයක් තියෙනවා.අපි කොට්ඨාස 08 ක් දිනුවත් වැඩක් නෑ.අපිට මේක පාලනය කරගෙන යන්න බැරි නම්.කොට්ඨාසය දිනපු පක්ෂයට පුලුවන් වෙන්න ඕනිනේ ආයතනය පවත්වා ගෙන යන්න.අධිකරණයට වත් නඩු තීන්දුවක් දෙන්න බැරි පනතක් තමයි දැන් තියෙන්නේ.මේක බොහොම අරාජික පනතක්.පනත සංශෝධනයක් සිදු විය යුතුයි.සහකාර කොමසාරිස්තුමිය එහෙමත් කුමන හෝ නෛතික ගැටලුවකට මැදිහත් වෙලා ඇති.මාව අසාධාරණ විධියට අයින් කළොත් මං හෙටම අධිකරණයට යනවා.නිකරුනේ අයින් වෙන්න මං කැමති නෑ.ජනතාවට සේවය කිරීම තමයි අපේ මූලික අරමුණ වෙන්න ඕනි.

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>

අපි 11 දෙනෙක් විරුද්ධ උන එකෙන් පවුල් කීයක් අසරණ උනාද.ඒවා ගැන සභාවේ කථා කරන්නේ නෑ.ඒවත් සාධාරණ විධියට තියෙන්න ඕනි.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>

පුලුවන් නම් සභාපතිතුමා අපේ දුරකථන දීමනාව හෝ ඉන්ධන දීමනාව වැඩි කරලා දෙන්න.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

සභාවෙන් වැඩි කරන්න නම් බෑ.ඉල්ලීම ආණ්ඩුකාරතුමා වෙත යොමු කරමු.